# සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ ලේඛන ව්‍යාජ ලෙස සකස්කර ඉදිරිපත් කිරීම පිළිබඳ අනතුරු ඇඟවීමයි

විදේශ තානාපති කාර්යාල, රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ වෙනත් විවිධ ආයතන වෙත ඉදිරිපත් කර ඇති, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සේවක අර්ථසාධක අරමුදල් (සේ. අ. අ.) දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන **අර්ධ වාර්ෂික ගිණුම් ප්‍රකාශ, සාමාජික ගිණුම් ශේෂය තහවුරු කිරීමේ ලිපි, සාමාජික දායක මුදල් ඉතිහාසය දැක්වෙන වාර්තා සහ අර්ථසාධක අරමුදල හා සම්බන්ධ "සී" වාර්තා** වැනි ලේඛන පිළිබඳව මතු වී ඇති සැකයන් හේතුකොටගෙන, එම ආයතන විසින් අදාළ ලේඛනවල සත්‍ය/අසත්‍යතාවයය තහවුරු කර ගැනීම සඳහා ඉල්ලීම් ගණනාවක් සේ. අ. අ. දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

**වීසා ලබා ගැනීම, විදේශ රැකියා සඳහා අයදුම් කිරීමේදී ස්ථිර රැකියාවක්/සේවා පළපුරුද්දක් ඇති බවට** මෙන්ම විවිධ රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රසම්පාදන පටිපාටි සඳහා අයදුම් කිරීමේදී ආයතනයෙහි **ස්ථාපිත බව, සේවා පළපුරුද්ද සහ කාර්ය මණ්ඩලයෙහි සාමාජික සංඛ්‍යාව** වැනි කරුණු තහවුරු කිරීම සඳහා එවැනි ව්‍යාජ ලෙස සකසන ලද ලේඛන ඉදිරිපත් කර ඇති බවට තොරතුරු වාර්තා වී තිබේ.

රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සහ වෙනත් විවිධ ආයතන විසින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සේ.අ.අ. හා සම්බන්ධ ලේඛන වලට අනුව, ඇතැම් පුද්ගලයන් සහ සංවිධාන ව්‍යාජ ආයතනික නම්, ලිපිනයන්, සාමාජික අංක, සාමාජික නම් සහ සාමාජික දායක මුදල් පිළිබඳ ව්‍යාජ තොරතුරු ඇතුළත් ලේඛන සකස් කර ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වී ඇත.

**සේ.අ.අ. හා සම්බන්ධ ව්‍යාජ ලේඛන සැකසීම නීති විරෝධී කටයුත්තක් වන බැවින් එවැනි කටයුතු වල නිරත නොවන ලෙස මහජනතාව සහ අනෙකුත් සියලුම ආයතන වලින් ඉල්ලා සිටිනු ලැබේ. තවද, තමන් සතුව පවතින සේ.අ.අ. හා සම්බන්ධ ලේඛන සුරක්ෂිතව තබාගන්නා ලෙස අරමුදලෙහි සියලුම සාමාජිකයන් සහ සේවායෝජකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.**

**ඒ.පී.යු. තිලකරත්න**
**අධිකාරී**
**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව, 12 වන මහල, 5 වන කුලුන, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
☎ 0112477982 / 0112477984 @ sepf@cbsl.lk